**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**

Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division

கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

**සියලු ම හිමිකම් ඇවිරිණි.** **All rights reserved.** அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.

**ජ්‍යෙෂ්ඨ අංශය** | **සිංහල භාෂා හා සාහිත්‍යඥාන** | **කාලය පැය - 03 යි.**

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව **II** හා **III** කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**01.(අ) පහත සඳහන් පාඨවල අර්ථය ලියා ඉරි ඇඳි පදකවර විභක්තියට අයත් දැයි ලියන්න.**

i. තිලෝගුරු <u>**තෙමස්**</u> මුරුනට අබිදම් දෙසී.
ii. <u>**මෙත්නෙන්**</u> වෙර පරයනු.
iii. <u>**නරාන**</u> කළ කමට ඉඳුරෝ දෙස්.
iv. <u>**සුරා සොඬුන් කෙරේ**</u> සබවසක් කොහි ද?
v. <u>**පින්සිපිහු**</u> කළ අත්කම්.
vi. <u>**සිරිවමිය**</u> පියතම උවිඳු .
vii. <u>**වතින්**</u> ගුරුන් අරියනු.
viii. <u>**මුනිඳා**</u> වැළඳු පා දා.
ix. දෙව්දත් <u>**දැහැනෙන්**</u> පිරිහිණි.
x. <u>**මහණෙනි**</u> බවුන් නොපිරිරව්. (ලකුණු - 2x 10 = 20)

**(ආ) කෙටි පිළිතුරු සපයන්න**

i. **පාලි රසවාහිනිය** උපයෝගී කර ගෙන ගම්පොළ යුගයේ රචිත සිංහල ධර්ම ග්‍රන්ථය කුමක් ද ?
ii. **පඤ්චිකා ප්‍රදීපය** කවුරුන් විසින් රචනා කළ කෘතියක් ද?
iii. **ඉෂ්ට දෙවියා, වලව්වක පලඟිලව්ව** යන කෘතිවල රචකයා කවු ද ?
iv. **"නොනිමි සිත්තම සහ තවත් කෙටි කතා"** යන කෙටිකතා සංග්‍රහයේ කතුවරයා නම් කරන්න.
v. දැනට විද්‍යමාන **ආදිතම** සිංහල කෘතිය කුමක් ද?
vi. පොලොන්නරු සාහිත්‍ය යුගයේ රචිත **ගී කාව්‍ය** කෘති මොනවා ද?
vii. සිව්පද ආරෙන් රචනා වී ඇති **ප්‍රථම** සිංහල මහාකාව්‍ය කෘතිය කුමක් ද?
viii. **සියබස්ලකර** කුමන ග්‍රන්ථයක අනුවාදයක් ලෙස සැලකේ ද ?
ix. කෝට්ටෙ යුගයේ රචිත **ඛණ්ඩ කාව්‍යය** කුමක් ද ?
x. සිංහල ඡන්දස් ශාස්ත්‍රය හැදාරන්නවුන් සඳහා ම දහතුන්වැනි සියවසේ දී රචනා වී ඇති කෘතිය නම් කරන්න.

(ලකුණු - 2x 10 = 20)

## <u>II කොටස</u>

**02.** **විදෑ වතින් තොර - සිය දෑ වතට සමවත**
**වෙසෙසා සබඳ සඳ වත - වෙසෙසුන් සමස් එ වියූ**

i. ඉහත පාඨයේ අර්ථය දක්වන්න. (ලකුණු 5)
ii. විශේෂණ සමාසයෙ ප්‍රභේද පහක් නම් කරන්න. (ලකුණු 5)
iii. එයින් දෙකකට උදාහරණ දෙක බැගින් දෙන්න. (ලකුණු 5)

03. **අකම් සකම් වේ - පියදුම් ලද විසාහි**
**බහුකම් සකම් පියදුම් - ලද හට ලවා හා වේ**

i. උක්ත පාඨයේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 5)
ii. ප්‍රයෝජ්‍ය ක්‍රියාව සිදත් සඟරාවේ විග්‍රහ කර ඇති ශීය සඳහන් කර, එහි අර්ථය ද ලියා දක්වන්න. (ලකුණු 5)
iii. ප්‍රයෝජ්‍ය ක්‍රියාව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 5)

04. **"පෙර සර නොලොපා 'ය' 'ව' 'ර' න් අගම් කෙළෙන් අගම් සද නම්"**

i. ඉහත පාඨයේ අර්ථය ලිහිල් බසින් ලියා දක්වන්න. (ලකුණු 5)
ii. ආගම සන්ධිය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

## III කොටස

**05. පහත සඳහන් සන්දේශ කාව්‍යයන්ට අදාළ ව දී ඇති වගුව සම්පූර්ණ කරන්න.**

| | සංදේශ කාව්‍යය | කර්තෘ | පරමාර්ථය | ගමනාන්තය |
|---|---|---|---|---|
| i. | මයුර සන්දේශය | | | |
| ii. | පරවි සන්දේශය | | | |
| iii. | හංස සන්දේශය | | | |
| iv. | ගිරා සන්දේශය | | | |
| v. | සැළලිහිණි සන්දේශය | | | |

(ලකුණු 3 x 5 = 15)

**06. පහත සඳහන් පද්‍ය පාඨයන් ඇතුළත් වන ග්‍රන්ථයේ නම, එහි කතුවරයා හා රචනා වී ඇති යුගය නම් කරන්න.**

vi. තමා වරද ස නොදිස්නෙ මෙරමා දොස්මැ දිස්නේ
vii. තෙවළා වදනිසරු විජයබ තෙරිඳු හට
viii. එ හසුන් පැසුළු පවසම් රස නුසුන්කොට
ix. ගෙන බමුණන් කතා - කරවන යාග මෙ සතා
x. එබැවින් එළුවෙන් කීවැ යි අනදර (ලකුණු 3 x 5 = 15)

**07. පහත සඳහන් සාහිත්‍ය කෘති පිළිබඳ කෙටි සටහන් ලියන්න.** (කතුවරයා, යුගය සහ පරමාර්ථය යන මූලික කරුණු අන්තර්ගත විය යුතු යි.)

i. පන්සිය පනස් ජාතක පොත
ii. සුභාෂිතය
iii. සද්ධර්මරත්නාවලිය
iv. කාව්‍යශේඛරය
v. සද්ධර්මාලංකාරය (ලකුණු 3 x 5 = 15)